එච්. එම්. විජිත හේරත්, පා. ම.
எச். எம். விஜித ஹேரத், பா. உ.
H. M. Vijitha Herath, M. P.
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය
வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சர்
Minister of Foreign Affairs, Foreign Employment and Tourism

# විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගේ වෙසක් දින පණිවිඩය

මෙම උතුම් වෙසක් පොහොය දිනයේදී, සියලුම ශ්‍රී ලාංකිකයින්ට සහ ගෝලීය බෞද්ධ ප්‍රජාවට මම උණුසුම් සුබ පැතුම් පිරිනමමි. බුදුරජාණන් වහන්සේගේ උපත, සම්බුද්ධත්වයට පත්වීම සහ සම්බුද්ධ පරිනිර්වාණය සිහිපත් කරන මෙම පූජනීය දිනය, ලොව පුරා සිටින මිලියන සංඛ්‍යාත ජනතාවට ගැඹුරු ආත්මාවලෝකනයක් සහ ආධ්‍යාත්මික පුනර්ජීවනයක් ඇතිකරවන මොහොතකි.

ගැටුම් සහ ආර්ථික විෂමතාවන්ගේ සිට පාරිසරික අර්බුදය දක්වා සංකීර්ණ අභියෝගවලට ලෝකය මුහුණ දෙන මොහොතක, බුදුන් වහන්සේගේ අකාලික ඉගැන්වීම් ප්‍රඥාව සහ මග පෙන්වීම අපට අඛණ්ඩව ලබා දෙයි. අප තුළ ඇති ලෝභය, ද්වේශය සහ මෝහය ජය ගැනීම සඳහා බුදුන් වහන්සේ අපට මතක් කර දෙන්නේ කල්පවත්නා සාමය ආරම්භ වන්නේ අභ්‍යන්තර පරිවර්තනයකින් බවයි. ධර්මයෙන් හැඩගැසුණු ජාතියක් ලෙස, ශ්‍රී ලංකාව පාලනයේ සහ ගෝලීය සහයෝගීතාවේ සෑම අංශයකම පාහේ අනුකම්පාව, නිවැරදි සිහිය  සහ යුක්තිය ප්‍රවර්ධනය කිරීමට කැපවී සිටියි.

පොහොසත් බෞද්ධ උරුමයක් ඇති ජාතියක් ලෙස, ශ්‍රී ලංකාව සිය ජාතික ගමනට මග පෙන්වන බලවේගයක් ලෙස බුද්ධ ධර්මය අඛණ්ඩව ආරක්ෂා කරයි. "ක්ලීන් ශ්‍රී ලංකා" ප්‍රතිපත්තිය වැනි මූලපිරීම් හරහා, තිරසර හා දයානුකම්පිත සංවර්ධනය සඳහා අපගේ කැපවීම ශක්තිමත් කරමින්, පාරිසරික වගකීම සහ සමාජ සමානාත්මතාව සමඟ ආර්ථික ප්‍රගතිය පෙළගස්වා ගැනීමට අපි වෙර දරමු.

වෙසක් උත්සවය සැමරීම එක්සත්කම සහ සදාචාරාත්මක ධෛර්යය වර්ධනය කරගැනීම සඳහා අපි අවස්ථාවක් කර ගනිමු. අපි මෙම උතුම් මාර්ගයේ එක්ව ගමන් කරන විට, මෙත්තා, කරුණා, මුදිතා සහ උපේක්ඛා යන ගුණධර්ම පදනම් කරගත් ලෝකයක් ගොඩනැගීමට අපි උත්සාහ කරමු. ඔබ සැමට අධ්‍යාත්මික වශයෙන් උසස් සාමකාමී වෙසක් උත්සවයක් වේවායි මම ප්‍රාර්ථනා කරමි.

විජිත හේරත්
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය
2025 මැයි 12

කාර්යාලය/அலுவலகம்/Office: +94-11-2430221, +94-11-2445498 ෆැක්ස්/பெக்ஸ்/Fax No. : +94-11-2430222
වෙබ් අඩවිය/வலைத்தளம்/Website: www.mfa.gov.lk - ඊමේල්/மின்னஞ்சல்/Email: fmo@mfa.gov.lk
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය, ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 01, ශ්‍රී ලංකාව
வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சு, குடியரசுக் கட்டிடம், கொழும்பு 01, இலங்கை.
Ministry of Foreign Affairs, Foreign Employment and Tourism, Republic Building, Colombo 01, Sri Lanka.